# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

# 1981 අංක 9 දරන
# නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1981 මාර්තු මස 06 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 35 යි

තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1981 අංක 9 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1981 පෙබරවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 52/79.

**1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 9 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*ලුහුඬු නාමය.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන, 1972 අංක 10 දරන නැව් නියෝජිතයන්ට බලපත්‍ර නිකුත් කිරීමේ පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

*1972 අංක 10 දරන පනතේ 2 වන වගන්තිය ඉවත් කිරීම.*

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

*ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

"(1අ) නැව් නියෝජිතයකුගේ ව්‍යාපාරය කරගෙන යාමට අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින්, තමා නැව් නියෝජිතයකු වශයෙන් ඒ ව්‍යාපාරය කරගෙන යාමට අපේක්ෂා කරනු ලබන්නේ යම් අයිතිකරුවකු, ප්‍රධානයකු, නැව් කුලියට ගන්නකු හෝ නෞකාධිපතියකු වෙනුවෙන් ද, අවස්ථාවෝචිත පරිදි, ඒ අයිතිකරු, ප්‍රධානයා, නැව් කුලියට ගන්නා හෝ නෞකාධිපති හෝ සඳහන් කරමින්, නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක උචිත බලධරයා වෙත ඉල්ලීමක් කළ යුතු ය.

(1අඅ) (1අ) උපවගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් උචිත බලධරයා විසින් අනුමත කරනු ලැබූ අවස්ථාවක, ඉල්ලුම්කරු විසින් නැව් නියෝජිතයකුගේ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නේ යම් අයිතිකරුවකු, ප්‍රධානයකු, නැව් කුලියට ගන්නකු හෝ නෞකාධිපතියකු වෙනුවෙන් ද අවස්ථාවෝචිත පරිදි ඒ අයිතිකරු, ප්‍රධානයා, නැව් කුලියට ගන්නා හෝ නෞකාධිපති සඳහන් කරමින් උචිත බලධරයා විසින් ඒ ඉල්ලුම්කරුට බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය :

එසේ වුව ද,—

(අ) නැව් නියෝජිතයකුගේ ව්‍යාපාරය නිසියාකාරව කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් ඉල්ලුම්කරුට නොමැති විටක ; නැතහොත්

(ආ) මේ පනතේ විධිවිධාන හෝ මේ පනත යටතේ සාදන ලද නියෝග අනුව ක්‍රියා කර නොමැති විටක

පමණක් ඔහු විසින් යම් ඉල්ලුම්කරුවකුට බලපත්‍ර යක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) 1971 අංක 11 දරන පනත යටතේ පිහිටුවන ලද ලංකා නැව් සංස්ථාව හැර, යම් සංස්ථාවක් සමාගම් ආඥාපනත යටතේ පිහිටුවා ලියා පදිංචි කර ඇත්නම් නැතහොත්, එසේ පිහිටුවා ලියා පදිංචි කරනු ලබන සංස්ථාවක් නම් මිස, ඒ සංස්ථාවට ; හෝ"; නම් ද

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියෙහි—

(අ) (අ) සහ (ආ) ඡේද අත්හැර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

"(අ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, මේ පනත යටතේ බලපත්‍රයක් ඉල්ලා සිටින යම් තැනැත්තන්ට තිබිය යුතු සුදුසුකම් ;

(ආ) බලපත්‍ර ප්‍රදානය කරනු ලබන්නේ යම් කාලයක් සඳහා ද ඒ කාලය සහ බලපත්‍ර ප්‍රදානය කරනු ලබන්නේ යම් නියම හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියම හා කොන්දේසි ;";

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ආආ) අයිතිකරුවකු, ප්‍රධානයකු, නැව් කුලියට ගන්නකු හෝ නෞකාධිපතියකු විසින් නැව් නියෝජිතයකු මාරු කිරීම සඳහා ඉල්ලුම් කළ හැක්කේ කවර අවස්ථානුගත කරුණු යටතේ ද යන වග සහ ඒ ඉල්ලීම සම්බන්ධයෙන් ක්‍රියා කළ යුත්තේ කවර ආකාරයෙන් ද යන වග ;".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත පමණ දායක මුදල් භාරගනු ලැබේ.